# සන්නස



**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.net
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**ඡායා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
email- sjturaus@optusnet.com.au

Kuma Gamage
0414 215 230
email- ads.sannasa@gmail.com

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

වැදගත්

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කා රකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න
සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

ඡායාරූප මහේෂ් මුණසිංහ

## ලියා දන්වන වග

### අවිද්‍යාවට යටවෙමින් තිබෙන සමාජයක්

**සමස්ථයක් වශයෙන් ශ්‍රී ලාංකික සමාජය ගමන් කරමින් සිටින මුග්ධ දිශාව පෙන්නුම් කරන සිදුවීම් නිතර නිතර අසන්නට දකින්නට ලැබෙයි . සිත කම්පා කරවන මේ බොහෝ සිදුවීම් අතරට අලුතින්ම අසන්නට ලැබෙන කතාව කුලියාපිටියේ දරුවකු පාසලට ඇතුල්කරගැනීමට විරුද්ධව විදුහල්පතිවරුන් ගුරුවරුන් දෙමාපියන් ඇතුළු විසල් බලවේගයක් විසින් මෙහෙයවනු ලබමින් සිටින ජුගුප්සාජනය ව්‍යාපායරයයි. දරුවාගේ පියා යම්කිසි ස්වසන රෝගයකින් මිය ගොස් ඇත. ඔහු මියගියේ ඒඩ්ස් රෝගයෙන් යයි කටකතාවක් පැතිරී තිබෙයි. දරුවා පාසලට ඇතුල් කර ගන්නට නොහැකි යයි මේ මුග්ධ සමාජය කෑමොර දෙන්නේ එනිසා ය.**

**දරුවාට හෝ දරුවාගේ දුප්පත් මවට හෝ ඒඩ්ස් රෝගය නැතැයි වෛද්‍ය වාර්තා පෙන්වා දෙයි. එහෙත් උගත් යයි කියනු ලබන අධ්‍යාපන බලධරයන් සහ විදුහල්පතිවරුන්ගේ සිට පහළට විහිදුනු පිරිසක් දරුවා ප්‍රතික්ෂෙප කරන්නේ වියරු වැටුණවුන් මෙන්ය. දරුවා ගෙන් කිසිවකුට ඒඩ්ස් රෝගය බෝ නොවන බව පළාතේ සෞඛ්‍ය නිලධාරිණිය කොයි තරම් කීවත් ඇහුම්කන් දෙන කිසිවකු නැත.**

**ශ්‍රී ලංකාව සාක්ෂරතාවෙන් ඉහළ තැනක සිටින රටක් බව කීවද බුද්ධිය අතින අප සිටින්නේ ඉතාම පහළ තැනක බව මේ සිදුවීම් අපට පෙන්වා දෙයි. අප තවමත් විශ්වාස කරන්නේ සත්‍යය හෝ විද්‍යාව නොවේ. අවිද්‍යාවයි. අන්ධ විශ්වාසයි. මේ මුග්ධභාවයෙන් කවදා කෙලසකින් ගැළවෙන්නට මේ සමාජයට හැකි වේදැයි සිතාගත නොහැක්කේ සමස්ථ සමාජයම අන්ධයන් සේ මිථ්‍යාව පසු පස දුවමින් සිටින සෙයක් පෙනෙන හෙයිනි. බහුතරයක් මාධ්‍ය හැසිරෙන්නේද මේ මිථ්‍යාව තහවුරු කරන ආකාරයටය. බුද්ධියට ඉඩ දෙනු වෙනුවට අවිද්‍යාවට ඉඩ දෙන සමාජයකට ඉදිරි ගමනක් නැත.**




# “එට්කා” ලංකාවේ ආර්ථිකය ඉන්දියාවට බිලිදෙයිද?

## අනුර කුමාර දිසානායක - ජ.වි.පෙ. නායක

ශ්‍රීලාල් සෙනෙවිරත්න



**ලංකාව සහ ඉන්දියාව අතර අස්සන් කිරීමට යෝජිත වෙළඳ ගිවිසුම මේ වන විට රට තුළ බලවත් විවාදයකට බඳුන්ව තිබේ. ජනතා විමුක්ති පෙරමුණ මෙම ගිවිසුමට බලවත් විරෝධතාවය පලකරන එක් දේශපාලන පක්ෂයකි. ඊට හේතු දක්වමින් එහි නායක අනුර කුමාර දිසානායක ඉකුත්දා කොළඹදී පැවැති සම්මන්ත්‍රණයකදී ඉදිරිපත් කළ මේ අදහස් දැනුම්වත් පුරවැසි ප්‍රජාවේ අවධානය සහ සංවාදය පිණිසය.**

එට්කා ගිවිසුම සම්බන්ධයෙන් දළ රාමුවක් ඉන්දියාවට ඉදිරිපත් කර තිබෙන අතර 2016 ජනවාරි අගදී ඒ පිළිබඳ ඉන්දියාවේ අදහස කියන බවත්, 2016 පෙබරවාරි අගදී දළ රාමුවට අත්සන් තබා 2016 වර්ෂයේ මැදදී ගිවිසුම අත්සන් කිරීමට ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. මීට පෙරත් ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳව විස්තීරණ සාකච්ඡාවක් 2003 සිට විවිධ ආණ්ඩු යටතේ සිදුකෙරෙමින් ආවා.

ඉන්දියාව සමග අත්සන් කිරීමට නියමිත මෙම ගිවිසුමේ දළ රාමුව පිළිබඳව තවමත් අවසන් අදහසක් පාර්ලිමේන්තුවට හෝ රටට ඉදිරිපත් කර නැහැ. වෙළඳ ගිවිසුම්වල අරමුණ විය යුත්තේ ප්‍රාග්ධනය රටට කැඳවීමයි. එය කෙටි කාලීනව අවාසි වුවත් දීර්ඝ කාලීනව අපිට වාසියි. ඒ වගේම අපේ රටේ නොමැති තාක්ෂණය ගිවිසුම් මගින් කැඳවීමට අවධානය යොමුකළ යුතුයි. අපේ රටේ නිෂ්පාදනයන්ගේ ලෝක වෙළඳපොළේ කොටස අත්පත් කරගැනීම සඳහා ගිවිසුම් යොදාගත යුතුයි.

### ඉන්දියා ප්‍රතිපත්තිය

ඉතාම ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියක් ඉන්දියාවට තිබෙන බව අපි පිළිගන්න ඕනෑ. 1975දී ඉන්දියාව විසින් සිකීමය ආක්‍රමණය කර ඉන්දියාවට ඈඳා ගන්නවා. 1987දී අපේ ගුවන් සීමාව බලහත්කාරයෙන් උල්ලංඝණය කරනවා. ජේ.ආර්.ජයවර්ධන යට කරලා අපේ රටට ඉන්දියානු හමුදාව එවනවා. 1987දී මුළුමනින්ම අපි යටත් කරන

12 වන පිටට